TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of Integrity

**ප්‍රතිචාර වාර්තාව - 2009.01.05**

## රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කමිටුවේ අතුරු වාර්තාවේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සම්බන්ධයෙන් සඳහන් වී ඇති කරුණු පිළිබඳ ප්‍රතිචාර වාර්ථාවයි.

රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂා කිරීමේ පාර්ලිමේන්තු තේරීම් කමිටුව (මෙතැන් සිට කමිටුව යනුවෙන් හැඳින්වේ) 2008 දෙසැම්බර් 8 වැනිදා තම අතුරු වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. මෙම වාර්තාවෙහි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අගතිගාමී සඳහන් කිහිපයක් දක්වා ඇති බැවින් මෙම ප්‍රතිචාර පත්‍රිකාව නිකුත් කරමු.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් යනු දූෂණයට එරෙහිව ක්‍රියත්මක වන ප්‍රධානතම ජාත්‍යන්තර සංවිධානයකි. එය රාජ්‍ය හා පෞද්ගලික අංශය, ආධාර සපයන්නන් සහ අනෙකුත් ගෝලීය කණ්ඩායම්වල ආකල්ප වෙනස් කිරීමේ අමුණින් විවිධ මට්ටමේ දූෂණ විරෝධී ක්‍රියාකාරකම්වල නිරත වේ. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා යනු උක්ත සංවිධාන සමූහයේ මෙරට ක්‍රියාත්මක නියෝජිත ආයතනයයි. එය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාත්‍යන්තර සංවිධානයේ වගකීම් සමඟ බැඳුණු, එය විසින් පිළිගත් වෙනමම ආයතනයකි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සහ දකුණු ආසියාවේ අනෙකුත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතන සමඟ එක්ව 2001 වසරේදී මහජන මත විමසුමක් සිදු කරන ලදි. එමගින් මහජනතාවගේ අවබෝධය අනුව දකුණු ආසියා කලාපයේ රටවල දූෂිතම ආයතනය පොලිසිය බව අනාවරණය කෙරුණි. ඒ අනුව පොලිසියේ දූෂණ පිළිබඳ වූ මහජන මතය සම්බන්ධයෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පොලිස්-මහජන සම්බන්ධතාව නැංවීමටත්, පොලිසියේ අවංකභාවය වර්ධනයටත් ව්‍යාපෘතියක් දියත් කරන ලදි.

ව්‍යවස්ථාවේ 28 වැනි වගන්තිය යටතේ ''මහජන දේපළ ආරක්ෂා කිරීමත් ඒවා අයථා ලෙස පරිහරණය කිරීම වැළැක්වීමත්'' මහජනයා වෙත පැවරුණු කාර්යභාරයකි. පොලිසිය යනු මහජන මුදලින් නඩත්තු වන ජනතා ආයතනයකි. එබැවින් පොලිසියේ දූෂණය වැළැක්වීමට හැකි සෑම පියවරක්ම ගැනීම පොලිස් නිලධාරීන්ගේ මෙන්ම මහජනතාවගේද වගකීමකි.

උක්ත ව්‍යාපෘතිය ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධයෙන් සිදු කරන ලද එබඳු පළමුවැන්නයි. එමෙන්ම එය රටේ යහපාලනය නඟා සිටවීම කෙරෙහි රාජ්‍ය සහ සිවිල් අංශ ද්වයම එක්වූ අද්විතීය අවස්ථාවකි. මෙම සන්දර්භය යටතේ එවකට තිබූ ජාතික පොලිස් කොමිසම සහ පොලිස්පතිතුමා එම සාමූහික ක්‍රියාකාරකම්වලට ධනාත්මක ප්‍රතිචාරයක් දැක්වීය. (මෙතැන් සිට එම ව්‍යාපෘතිය “පොලිස් ව්‍යෘපෘතිය” නමින් හැඳින්වේ).

2007 මාර්තු 14 දාතමින් ලිපියක් මගින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පාර්ලිමේන්තු තේරීම් කමිටුව හමුවට කැඳවන ලදි. කැඳවීම් ලිපිය සමඟ කමිටුවේ විශය පථය (Terms of Reference) නමැති ලියවිල්ලක්ද අමුණා තිබුණි. කමිටුවට අවශ්‍යව තිබුණේ 2007/01/31 දින ''අයිලන්ඩ්'' පුවත්පතේ ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩු මහතා ලියා පල කරන ලද "Thorough probe on overseas funded groups, individuals needed" නමැති ලිපියෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට එරෙහිව පළ කර තිබූ කරුණු පිළිබඳ වැඩි දුරටත් පැහැදිලි කර ගැනීමටය.

2008 දෙසැම්බර් 8 වැනිදා කමිටුවේ අතුරු වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණි. එම වාර්තාවෙහි ඉංග්‍රීසි පිටපතේ පිටු අංක 27-28 හි පොලිස් ව්‍යාපෘතිය පිළිබඳව සඳහන් වේ. නමුත් එහි ඇතුළත් තොරතුරු හා නිගමන සදොස් බැවින් එක් එක් කරුණ සම්බන්ධයෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හි ස්ථාවරය මෙමගින් පැහැදිලි කරන්නෙමු. තවද අතුරු වාර්තාවේ පොලිස් ව්‍යාපෘතියට අදාල ප්‍රකාශනයේ නිවැරදි නම පවා හඳුනාගැනීමට කමිටුව අසමත්ව තිබේ (ප්‍රකාශනයේ නම ''උත්තරීතර පොලිසියක් උදෙසා පොලිස් දූෂණයන්ට හේතු සාදක හඳුනාගැනීම'' යන්න ''ශ්‍රී ලංකා පොලීසිය'' යනුවෙන් වැරදි ලෙස සඳහන් කර ඇත.)

## 1. මූලික කරුණු

### 1.1 අහිතකර මාධ්‍ය ප්‍රචාරණය

තේරීම් කමිටුව පැවැත්වෙද්දී එහි සභාපතිත්වය දරමින් සිටි ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ ප්‍රකාශ උපුටා දක්වමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පිළිබඳව අහිතකර වාර්තා බොහොමයක් මාධ්‍යයන්හි පළ විය. කෙසේ වෙතත් මාධ්‍ය වාර්තා කෙතරම් පක්ෂග්‍රාහී, සාවද්‍ය සහ අතාර්කික වුවත් පවත්නා නීති සීමා හේතුවෙන් පාර්ලිමේන්තු වරප්‍රසාද පනත යටතේ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තුරු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය එම මාධ්‍ය වාර්තාවලට ප්‍රතිචාර දැක්වීමෙන් වැලකී සිටියේය.

2007 මාර්තු 21 වැනිදා කමිටුව හමුවේ පෙනීසිටි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා දූත පිරිස අහිතකර මාධ්‍ය ප්‍රචාරණයක් සිදුවූ බව දැන්වූහ. මාධ්‍ය මගින් කමිටු සභාපතිවරයාගේ උපුටනයක් හෝ කමිටුවේ සාකච්ඡාවන්හි සාරාංශයක් මගින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කෙරෙහි අහිතකර ආකල්පයකින් තොරතුරු පළ කළහ. නමුත් මතුවූ කාරණා පිළිබඳව කමිටුව සෑහීමකට පත්විය හැකි ආකාරයෙන් අප ආයතනය සිදුකළ කරුණු පැහැදිලි කිරීම් සඳහා කිසිදු මාධ්‍යයකින් ප්‍රචාරයක් නොලැබිණි.

ඉන් අනතුරුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කමිටුව හමුවේ පෙනී නොසිටි අවස්ථාවක කමිටුවේ රැස්වීමක් සම්බන්ධයෙන් 2007 මැයි 17 වැනිදා ''සන්ඩේ ටයිම්ස්'' පුවත්පතේ පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් පළ වී තිබිණි:

(a) මෙම ව්‍යාපෘතිය පිළිබඳව නිල ලිපි ලේඛන කිසිවක් පොලිස් මූලස්ථානයෙහි නොමැති බව නියෝජ්‍ය පොලිස්පති බෝධි ලියනගේ මහතා පැවසූ බවත්,

(b) සමීක්ෂණය සිදු කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අවසරය ලබා දුන්නේ කෙසේදැයි සඳහන් වාර්තාවක් පොලිසිය වෙතින් ලබාගැනීමට විජිත හේරත් මහතාට අවශ්‍ය වූ බවත්,

(c) තොරතුරු එක්රැස් කළේ මන්දැයි ඇතැම් පොලිස් නිලධාරීන් නොදැනුවත්ව සිටි බවත්,

(d) කමිටුවේ සාමාජිකයකු වූ පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක මහතා වාර්තාවෙහි අන්තර්ගතයට දැන්වත් අභියෝග කරන්නට පොලිසිය සූදානම්දැයි ඇසූ බවත්,

එහි සඳහන් විණි.

2007 ජූනි 5 දාතමින් කමිටුවට ලිපියක් ඉදිරිපත් කළ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය උක්ත වාර්තා මාධ්‍ය නිදහස යටතේ පළ කරන ලදැයි කමිටුව සලකන්නේ නම් ඊට පිළිතුරු දීමේ අයිතියද මාධ්‍ය නිදහස යටතේ ආරක්ෂා විය යුතු බව දන්වා සිටින ලදී. ඉන්පසුව කමිටුවෙන් ප්‍රතිචාරයක් නොලැබුනද පාර්ලිමේන්තු වරප්‍රසාද පනතේ විධිවිධාන නිසාවෙන් ඉහත වාර්තාවෙහි නිරවද්‍යභාවයට අභියෝග නොකිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය තීරණය කළේය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අවස්ථාවක් ලබාදී තිබුණි නම් 2007 මැයි 17 දාතමින් පළවූ මාධ්‍ය වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් කමිටුව නොමඟ ගොස් ඇති බව හා කමිටුව පූර්ව නිගමනවලට එළඹ ඇතිබව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා විසින් නිසැකවම ඔප්පු කර පෙන්වනු ඇත.

### 1.2 කිසිදු විශේෂ චෝදනාවක් එල්ල කර හෝ දැණුම් දී  නොතිබීම.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත කිසිදු අවස්ථාවකදී කිසිදු චෝදනාවක් ගැන කමිටුව විසින් දැණුම් දී නැත. නමුත් කමිටුව හමුවේ පෙනී සිටින්නට කැඳවීම් ලැබුණි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සංවිධානයේ නිලධාරීහු දෙදිනක් ඊට සහභාගි වූහ. එම නිලධාරීන් සහභාගි නොවූ අවස්ථාවන්හි පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු සහභාගි වූ බව පසුව මාධ්‍ය මගින් අනාවරණය විය.

ව්‍යාපෘතියට සම්බන්ධ වූ බලධරයා ලෙස හිටපු පොලිස්පතිතුමාගෙන් තොරතුරු ලබාගන්නා බව  කමිටුව විමර්ෂණයේදී ප්‍රකාශ කරන ලදී. කලින් තිබූ පොලිස් කොමිසමට ව්‍යාපෘතිය පිළිබඳ දැනුම් දී තිබූ අතර ඒ බව එම කොමිසම හොඳින් දැන සිටි බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි ස්ථාවරයයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලයේදී හිටපු පොලිස්පතිවරු දෙදෙනෙක් ඊට සහාය දැක්වීය. නමුත් අතුරු වාර්තාව මෙසේ සඳහන් කොට තිබීම මවිත කරවන සුළුය.

*''මෙම ව්‍යාපෘතිය ඇරඹීමට පොලිස් අවරසය ලබාගැනීම සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු සැපයීම නිසා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ට චෝදනා කිරීමට කමිටුවට සිදු විය.''*

මෙය පදනම් විරහිත, සම්පූර්ණයෙන්ම සාවද්‍ය ප්‍රකාශයකි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කමිටුව ඉල්ලන ලද සියළු තොරතුරු සැපයීය. එසේම, මහජන මුදලින් නඩත්තු වන කිසිදු ආයතනයක කටයුතු පරීක්ෂාව සඳහා කිසිදු මහජන ආයතනයක හෝ පාර්ලිමේන්තුවේ අවසරයක් සිවිල් සමාජයට අනවශ්‍යය යන්න ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ස්ථාවරයයි. පොලීසිය පිළිබඳ අධ්‍යයනය සාමූහික, ඒකාබද්ධ එකක් වූ අතර එමගින් සැපයුණු තොරතුරු අනුව ඒ බව කමිටුවට අවධාරණය විය. විශේෂයෙන් ම ව්‍යාපෘතිය ඇරඹීමට අවසර ලබාගැනීම සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු සපයන ලද බව පැවසීම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය තරයේ ප්‍රතික්ෂේප කරයි.

2007 මාර්තු 30 දිනැති ලේඛණයක් මගින් 2007 මාර්තු 21 දින කමිටුව විසින් මතුකළා වූ කරුණු පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ස්ථාවරය සවිස්තරාත්මකව පැහැදිළි කරණ ලදී. එම ලේඛණය ඉදිරිපත් කිරීමට ප්‍රධාන හේතුව වූයේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට එරෙහිව කිසිදු විශේෂ චෝදනාවක් ඉදිරිපත් කර නොතිබූ බැවින් සහ කමිටුවේ ක්‍රියා පටිපාටිය පිළිබඳව විශේෂ දැණුම් දීමක්ද නොතිබූ බැවිනි. එම කරුණු අනුව පොළිස් වාර්තාව පිළිබඳව යතාණුරූපීව සළකා බලන ලෙස කමිටු සාමාජිකයින්ගෙන් ඉල්ලා සිටින ලදී.

### 1.3 කමිටුවේ සටහන් ලබා නොදීම

2007 මාර්තු 22 දාතමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ඉදිරිපත් කළ ලිපියෙන් කමිටුව 2007 මාර්තු 21 වැනිදා පැවැත්වූ කමිටු රැස්වීමේ සටහන් වාර්තා ඉල්ලා සිටින ලදි. නමුත් 2007 මාර්තු 30 වැනිදා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත කමිටුවෙන් ලැබුණු ලිපියේ පහත සඳහන් දැනුම්දීම කර තිබුණි.

*''පාර්ලිමේන්තු කමිටුවක කිසිදු වාර්තාවක් ඒවා පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කිරීමට පෙර ප්‍රකාශයට පත් කිරීම බලයන් හා වරප්‍රසාද සම්බන්ධ පාර්ලිමේන්තු පනතේ 9 වන වගන්තියේ B කොටස යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දඬුවම් ලැබිය හැකි වරදකි. එබැවින් ඔබගේ ඉල්ලීමට එකඟවීමට නොහැකි වීම ගැන කනගාටු වෙමි.''*

එබැවින් කමිටුව හමුවට කැඳවූ හිටපු පොලිස්පතිවරුන් හෝ වෙනත් පොලිස් නිලධාරීන් කමිටුවට පැවසූ දෑ පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කිසිත් නොදනී. ඕනෑම පුද්ගලයකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් අගතිගාමී නිගමනයකට එළඹෙන විට ඒවාට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට අවකාශ සලසා දීම පරීක්ෂණය සිදුකරන බලධාරීන්ගේ මූලික යුතුකමකි. කමිටුව මෙම ස්වභාවික යුක්තියේ මූලික ප්‍රතිපත්තිය වත් රැකීමට අසමත් වී ඇත.

### 1.4 ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කෙරෙහි අදාල නොවන පොදු විවේචනයන්

තවද කමිටුවේ තාවකාලික අතුරු වාර්තාවේ නිර්දේශයන්හිදී රාජ්‍ය නොවන සංවිධාන විගණනයට ලක් නොවන බව පවසයි. මේ කිසිවක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කෙරෙහි අදාල නොවේ. මන්ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි ගිණුම් පිළිගත් විගණන ආයතනයක් මගින් විගණනය කෙරෙනවා පමණක් නොව අන්තර්ජාලය ඔස්සේද ප්‍රචාරයට හැකි සෑම පියවරක්ම ගනු ලැබේ.

## 2. විමර්ෂණය අතරතුරදී හෙළිදරව් වූ දෑ

පාර්ලිමේන්තු කමිටු සාමාජිකයින් 26 දෙනාගෙන් අදාල විමර්ෂනයට එක් වරකට පෙනී සිටියේ 3-4 දෙනෙකු පමණි. විමර්ෂණයේ පළමු දින වූ 2007 මාර්තු 21 වැනිදා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි සභාපතිවරයා (ඔහු අධ්‍යක්‍ෂ මණ්ඩලයේ විධායක නොවන ප්‍රධානියාය) සමඟ විනාඩි 45 ක් විගණකාධිපති දෙපාර්තමේන්තුව ගැන සාකච්ඡා පැවැත්වූ අතර ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතන දූත කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් කැඳවන ලද්දේ ගරු ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමා විසින් අනෙක් අය එළියේ රැඳී සිටින බව පැවසීමෙන් අනතුරුවය.

කමිටුව සමඟ පැවැත්වූ සාකච්ඡාවේදී කමිටුව මතුකළා වූ සියළු ප්‍රශ්න පිළිබඳව කමිටුව සෑහීමකට පත්කිරීමට හැකි වූ බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි විශ්වාසයයි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නිලධාරීන් කැඳවූ අනෙක් අවස්ථාව 2007 ජූනි 28 වැනිදාය. එහිදී එක් අධ්‍යක්ෂවරයෙක් (හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයකු) සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා කෙටියෙන් අදහස් දැක්වූහ. කමිටුවද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙතින් තවදුරටත් කිසිදු තොරතුරක් බලාපොරොත්තු වූ බව කිසිවෙක් දැන්වූයේ නැත.

## 3. පොලිස් ව්‍යාපෘතියෙන් සමාජ යහපතට අහිතකර බලපෑමක් සිදුවීද?

පොලිස් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අතිශයෙන් වැදගත් වූ පහත කරුණු අවධාරණය කළ යුතුය:

(a) පොලිසිය මහජන මුදලින් නඩත්තු වන ආයතනයක් බැවින් මහජනතාව විසින් එහි කටයුතු විචාරීම අවශ්‍යය. අවාසනාවකට කිසිදු සංවිධානයක් හෝ පොලිසිය විසින්ම හෝ පොලිසියේ යහ පාලනය සම්බන්ධ ගැටළු හඳුනා ගැනීම පිළිබඳ පුළුල් උත්සාහයක් මින් පෙර දරා නොතිබුණි. තවද පොලිස් දෙපාර්තමේන්තුව ස්වාධීන විමසුමකට හා වගකීමකට ලක් කළ යුතු බව 2001 වර්ෂයේදී හඳුන්වා දුන් 17 වන ව්‍යවස්ථා සංශෝධනයේදී පිළිගනිමින් ජාතික පොලිස් කොමිසමක්ද පිහිටුවන ලදී.

(b) මෙබඳු අධ්‍යයනයන් පොලිසියට තමන් විවෘත ආයතනයක් බව පෙන්වීමට උපකාරි වේ. එමෙන්ම ශ්‍රී ලංකාව ක්‍රියාකාරී ප්‍රජාතන්ත්‍රවාදී රටක් බව ලෝක ප්‍රජාවට ඒත්තු ගැන්වීමටද උපකාර වෙයි.

(c) ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇති, එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය යටතේ රජය සිවිල් සමාජය හා එක්ව දූෂණය පිටුදැකීමට බැඳී සිටී. අනාගතයේදී මහජන ආයතන සහ සිවිල් සමාජය ඒකාබද්ධව සිදු කරනු ලබන කවර උත්සාහයක් වුව වැලැක්වීමට අසාධාරණ ලෙස මැදිහත්වීමක් සිදු වුවහොත් එය රටවැසියාගේ යහපතට හා රටේ ප්‍රතිරූපයට අයහපත් අයුරින් බලපානු ඇත.

(d) පොලිසියේ තත්ත්වය වර්ධනයට සිදුකරන මහජන ක්‍රියාකාරකම් මගින් පොලිසිය කෙරෙහි සමාජයේ වැඩි පිලිගැනීමක් ඇති වේ. සැබැවින්ම, පොලිසිය පිළිබඳ ව්‍යාපෘති වාර්තාව බුද්ධිමතුන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් නිතර භාවිතයට ගනු ලැබේ. එමෙන්ම එය පොලිසියටද ප්‍රතිපත්ති සම්පාදකයින්ටද, පොලිසියට කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීමට ඇති දුෂ්කරතාවන් හඳුනා ගැනීමට ද උපකාරි වී ඇත. එබැවින් එබඳු අධ්‍යයනයක් ජනතා යහපත පිණිස වන අතර එම අධ්‍යයනයට උපකාර කළ අය එසේ කොට ඇත්තේ ද අවංක චේතනාවෙන් බව නොරහසකි.

(e) පොලිසිය දූෂිත බැවින් ශ්‍රී ලංකාව පිරිහුණු රාජ්‍යයක් ලෙස නම් කළ යුතු යැයි පොලිස් වාර්තාව යෝජනා කර ඇති බව පැවසීම සාවද්‍යය. පොලිසිය දූෂිත බව පොලිස් වාර්තාවෙන් අවධාරණය කරන බව පවසන්නන් එක්කෝ පොලිස් වාර්තාව කියවා නැත; එසේ නැතහොත් ඔවුහු අවංක අදහසින් ව්‍යාපෘතියට සහාය දැක්වූ නිලධාරීන්ට පහර ගැසීමේ පටු අදහසින් පසු වන්නෝය.

## 4. ''පොලිස් ව්‍යාපෘතිය'' කිසිදු අයුරකින් ජාතික ආරක්ෂාවට අහිතකර ලෙස බලපෑමක් සිදු කර ඇත්ද?

පොලිස් ව්‍යාපෘතිය ජාතික ආරක්ෂාවට අහිතකර අයුරින් බලපා ඇති බවට කමිටුවේ 'නිගමනය' සම්පූර්ණයෙන්ම පදනම් විරහිත, වැරදි සහගත එකකි. එබැවින් පහත සඳහන් ප්‍රධාන කරුණු පිළිබඳව අවධානය යොමු කරවමු:

(a) ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නිලධාරීන් කමිටුවට පුන පුනා පෙන්වා දුන්නේ අදාල ව්‍යාපෘතියට පොලිසියේ කිසිදු වර්ගීකරණය කරණ ලද තොරතුරක් (Classified Information) අවශ්‍ය නොවූ බවයි. ඉල්ලා සිටි, ලබාගත් තොරතුරු පහත සඳහන් පරිදිය:

- ධනාත්මක තොරතුරු (දූෂණය පිටුදැකීමට පොලිසියේ උත්සාහයන්, මානව හිමිකම් සුරැකීම්, පොලිසියේ ප්‍රතිරූපය ගොඩනැංවීම, කාර්යක්ෂමතාව වර්ධනය)
- පොලිසියේ ආයතනික ව්‍යුහය (ආධුනිකයින් බඳවාගැනීමේ පටිපාටිය, උසස්වීම් පිළිවෙත, පාරිතෝෂික ක්‍රමයන්, විනය විධිවිධාන යනාදිය)
- පොලිස් කාර්යයන් (අපරාධ සංඛ්‍යානනය, පොලිස් අකාර්යක්ෂමතාව සහ පොලිස් ප්‍රජාවේ අන්තර් සම්බන්ධය පිළිබඳව වාර්තා වූ සිද්ධි, මෙහෙයවන ලද විනය පරීක්ෂණ ලැයිස්තුව)

(b) එපමණක් නොව, ඕනෑම ශිෂ්ට සමාජයක් හෝ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක රටක වන මෙම තොරතුරු ජනතාවට නිදහසේ ලබාගැනීමට හැකි විය යුතු බව පිළිගනියි.

(c) අදාල ව්‍යාපෘතිය සඳහා පොලිස් බුද්ධි අංශය, රහස්‍ය තොරතුරු හෝ විශේෂ කාර්ය බලකායේ කටයුතු පිළිබඳව කිසිදු තොරතුරක් ලබා ගෙන නොමැත. ව්‍යාපෘතියෙන් සොයා බැලුවේ පොලිසියේ ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් පමණි. එබැවින් කිසිදු රහස්‍ය හෝ පෞද්ගලික තොරතුරක් නොඉල්ලන ලදී.

(d) ජාතික ආරක්ෂාව අතිශයින් වැදගත් වුවද නීත්‍යානුකූල තොරතුරු වසං කිරීම හෝ එබඳු තොරතුරු ලබාගැනීමට මහජනතාවට ඇති හැකියාව අහුරා දැමීම එයින් අදහස් නොවේ.

(e) පොලිස් ව්‍යාපෘතිය මෙහෙයවන ලද කණ්ඩායම මහජන ගෞරවයට පාත්‍ර වූ හා සුපිළිපන් නිළධාරී මණ්ඩලයක් වූහ. එබැවින් ඔවුන් ජාතික ආරක්ෂාව කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවන අයුරින් ක්‍රියා නොකරනු ඇති බව අවබෝධ කරගැනීම වැදගත්ය. එමෙන්ම ව්‍යාපෘතියට සහාය වූ ජාතික පොලිස් කොමිසමද, පොලිස් නිලධාරීන්ද, පොලිස්පතිවරුන්ද පොලිසියේ සහ මහජනතාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක වූ බවත් ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු වන්නට ඇති බවත් පූර්ව නිගමනය කළ හැකිය.

(f) අපරාධ මර්ධනය සහ ත්‍රස්තවාදය මැඩලීම සම්බන්ධයෙන් පොලිසියට කාර්යක්ෂමතාව අත්‍යවශ්‍ය බව නොරහසකි. ශ්‍රී ලංකා පොලිසියට කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීමට ඇති බාධාවන් හඳුනා ගැනීමට මෙබඳු අධ්‍යයනයකින් උපකාර සැලසෙනු ඇත. එබැවින් මෙම අධ්‍යයනය පොලිසියට ජාතික ආරක්ෂාව පිළිබඳව ධනාත්මකව සේවා සැලසීමට සහාය වන්නකි. එබඳු අධ්‍යයනයක් හෝ ව්‍යාපෘතියක් වැලැක්වීමට ගනු ලබන ඕනෑම උත්සාහයක් දීර්ඝකාලීනව රටේ පරිහානියටම හේතු වන්නේය.

## 5. නොරාඩ් ආධාර

අන්තර් වාර්තාවේ මෙසේ සඳහන් කොට ඇත, *''රටෙහි බෙදුම්වාදී ක්‍රියාවන්ට ආධාර සපයන බවට අපකීර්තිමත් නාමයක් හිමි කරගෙන සිටින නොරාඩ් සංවිධානය විශාල මුදලක් වැය කරමින් රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ මෙම ව්‍යාපෘතිය දියත් කොට ඇත.''*

ඒ සම්බන්ධයෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙහි ප්‍රතිචාරය මෙසේය:

පළමුව, මෙම ව්‍යාපෘතිය ඇරඹුවේ නොරාඩ් සංවිධානය නොවේ. කිසිදු ආධාර කණ්ඩායමක සහාය නොමැතිව සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ආධාර කණ්ඩායම්වලට ආරාධනා කරන ලද්දේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය යි. දෙවනුව, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් නොරාඩ් සංවිධානය තෝරාගනු ලැබුවේ තවත් බොහෝ ගණනක් ආධාර කණ්ඩායම් අතරිනි. ආධාර සංවිධානයක් වශයෙන් නොරාඩ් සංවිධානය ජාත්‍යන්තරව කීර්තියක් අත් කරගෙන සිටි අතර ව්‍යාපෘතියක අන්තර්ගතයන් සම්බන්ධයෙන් ඇඟිලි නොගසන බවට අවංකභාවයක් පෙන්නුම් කර ඇති සංවිධානයකි. මෙම නොරාඩ් ආයතනය පිළිබඳ අයහපත් මහජන මතයක් ගොඩනගා ඇත්තේ දේශපාලන පක්ෂ කිහිපයක් විසිනි. එය සිවිල් සමාජයේ ක්‍රියාකාරීත්වයට එතරම් වැදගත් දෙයක් නොවේ. සැබැවින්ම, නොරාඩ් සංවිධානය මෙරට රාජ්‍ය ආයතන බොහොමයකට ආධාර සපයන්නෙකි. විදේශ කටයුතු අමාත්‍යංශය, කර්මාන්ත අමාත්‍යංශය, ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යංශය, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යංශය, සංස්කෘතික අමාත්‍යංශය සහ සංස්කෘතික අරමුදල ඉන් සමහරකි. එම නිසා එබඳු මූලාශ්‍රයකින් ලැබෙන මූල්‍ය ආධාර ප්‍රතික්ෂේප කිරීමට සිවිල් සංවිධානයකට කිසිදු තාර්කික හේතුවක් නොමැත.

ව්‍යාපෘති යෝජනාවෙහි ගුණදොස් විමසීම, විෂය පථය (Terms of Reference) අනුමත කිරීම, ගිවිසුමට බැඳීම, එකඟ වූ ගෙවීම් සිදුකිරීම හැරුණු විට නොරාඩ් සංවිධානය විසින් ව්‍යාපෘතියේ මෙහෙයුම්, තීරණ ගැනීම්, තොරතුරු හුවමාරු කරගැනීම් යනාදි කිසිදු ක්‍රියාවලියක නිරත වී නොමැත. එබැවින් මෙම ව්‍යාපෘතියෙන් රහස්‍ය තොරතුරු ලබාගැනීමට නොරාඩ් සංවිධානයට අවශ්‍ය වූ බව පැවසීම සම්පූර්ණයෙන්ම සාවද්‍යය. තවද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් 'රහස්‍ය තොරතුරු' ලබාගත් බවටද ඒවා නොරාඩ් සංවිධානය වෙත 'යැවූ' බවටද කරන වක්‍ර දෝෂාරෝපණ කිසිවක් ඔප්පු කිරීමට කමිටුවට සාක්ෂි නොමැත. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කමිටුව හමුවට කැඳවීමට කලින්ම 2007 මාර්තු 11 වැනිදා සිළුමිණ පුවත්පතෙහි පළවූ ලිපියක තවත් සාවද්‍ය කරුණක් පළ වී තිබුණි. පොලිසියේ රහස්‍ය තොරතුරු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් නෝවේ රටට විකුණා ඇති බවත් මෙම ව්‍යාපෘතිය මගින් එබඳු තොරතුරු ලබාගැනීමට නෝර්විජියානු රාජ්‍ය නොවන සංවිධාන සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය අතර ගිවිසුමක් ඇති කරගෙන ඇති බවටත් කමිටුවේ සභාපතිවරයා උපුටා දක්වා තිබුණි. මෙම ප්‍රකාශයන්හි කිසිදු සත්‍යතාවක් නොමැති බවත් ඒවා අසත්‍ය වංක ප්‍රකාශ බවත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය තරයේ ප්‍රකාශ කරයි.

## 6. ව්‍යාපෘතියේ සාධාරණත්වය

පොලිසියේ සහ සිවිල් සමාජයේ සාමූහික ප්‍රයත්නයක් වූ පොලිස් ව්‍යාපෘතියෙහි අවංකත්වය පහත සඳහන් කරුණුවලින් පැහැදිලි වේ:

(a) 2002 වසරේ සිදුකරන ලද මහජන මත විමසුම් සමීක්ෂණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එය ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාව පැන නැගුණි.

(b) ව්‍යාපෘතියෙහි හුදු උරුමකරුවන් වූයේ පොලිසිය සහ මහජනතාවයි. පෙන්වා දී ඇති පරිදි ව්‍යාපෘතිය මගින් පොලිසිය බොහෝ ප්‍රතිලාභ ලබා ඇත.

(c) පොලිසියේ පූර්ව අවසරයකින් තොරව ව්‍යාපෘතියෙහි කිසිවක් ජනතාව වෙත මුදාහැර නොමැත. සෑම අවස්ථාවකදීම පොලිසියේ උපදේශනය ලබා ගන්නා ලදි. උදාහරණයක් වශයෙන් සමීක්ෂණයට යොදාගත් ප්‍රශ්නාවලි පොලිස්පතිවරයාගේ නිරීක්ෂණයට යටත් කොට අනුමත කොට ගැනුණි. වාර්තා කෙටුම්පත ප්‍රකාශයට පත් කිරීමට පෙර පොලිස් දෙපාර්තමේන්තුවට යවා ගුණදොස් විවේචනයට යොමු කරන ලදි. විරුද්ධවීමට, නිවැරදි කිරීමට, වෙනස්කම් ඉල්ලා සිටීමට, වාර්තාවෙහි දත්ත/තොරතුරු ඉවත් කිරීමට දෙපාර්තමේන්තුවට අවස්ථාවක් ලබා දුනි.

(d) ව්‍යාපෘතිය පිළිගත් විගණන සමාගමක් විසින් සම්පූර්ණයෙන්ම විගණනය කෙරුණු අතර ව්‍යාපෘතියේ කටයුතු අදාල සැම දෙනාගේ මනාපයට හේතු විය.

## 7. මහජනයාට තොරතුරු ලබාගත හැකිවිය යුත්තේ ඇයි ද යන්න පිළිබඳ විභාගය

කමිටුව මගින් කර ඇති විමර්ෂණයේදී මූලිකව සිදුවූයේ පොලිසියෙන් තොරතුරු මුදාහැරීමේ ප්‍රශ්නයක් සම්බන්ධයෙනි. ඕනෑම ශිෂ්ටසම්පන්න රටක පාර්ලිමේන්තුව ඇතුළුව සෑම ආයතනයක්ම තොරතුරු ලබා දීමේ අයිතියට ගරු කරනු ලබයි. බොහෝ රටවල පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ගත්, රජය විසින් ගරු කරනු ලබන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති පවතී. පාර්ලිමේන්තුව මගින් එම අයිතියට අභියෝග කිරීමේ අහිතකර ප්‍රතිඵලය වනුයේ නීත්‍යානුකූල තොරතුරක් පවා මෙරට ජනතාවට ලබා දීමට මැලි වන තරමටම රාජ්‍ය ආයතන පසුගාමී වීමයි. මෙබඳු රහසිගත පසුබිමක් යටතේ දේශපාලන පක්ෂ, රාජ්‍ය ආයතන, ඇතුලු සෑම අංශයකම මුදල් සම්බන්ධ දූෂණ ගැන පමණක් නොව තම බලය අයුතු ලෙස පරිහරණය කිරීමෙන් ද දූෂණයක් විය හැකිය. එබැවින් මහජනතාවට අවශ්‍ය තොරතුරු මුදාහැරීම මගින් රාජ්‍ය ආයතන පිළිබඳ විශ්වාසය වැඩිදියුණු හේතුවක් වනු ඇත.

## 8. නිගමනය

ඉහත කාරණා අනුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පිළිබඳව සිදුකර ඇති අගතිගාමී සටහන් අතුරු වාර්තාවට ඇතුලත් කිරීමට පෙර ස්වභාවික යුක්තියේ මූලධර්ම අනුගමනය කිරීමට කමිටුව අසමත්ව ඇති බව නිගමනය කරමු. තවද පොලිස් ව්‍යාපෘතියේ ධනාත්මක කාරණා කමිටුව හිතාමතාම නොසලකා හැර ඇත.

ශ්‍රී ලංකාවෙහි තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීති බලපවත්වන්නේ නම් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය හෝ වෙනත් කිසිදු ආයතනයකට තොරතුරු ලබාගැනීම සඳහා පොලිසිය මත යැපෙන්නට සිදු නොවනු ඇත. **පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාගත හැකි සියළු තොරතුරු ඔවුන් නියෝජනය කරන මහජනතාවටද ලබාගැනීමට හැකියාව ඇති කරන නීතිමය රාමුවක් ඇති කළ යුතු** බවට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ යෝජනාවයි. එබැවින් මන්ත්‍රීවරුන්ට ලබාගත හැකි තොරතුරු සියල්ල මහජනතාවට ලබාගත හැකි වන පරිදි තොරතුරු ලබාගැනීමේ අයිතිය ආරක්ෂාවන නීති පද්ධතියක් නිර්දේශ කරන්නැයි අපි කමිටුවෙන් ඉල්ලා සිටිමු.

කමිටුව මෙම තීන්දුවලට පැමිණ ඇති ආකාරය සලකමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනු ලැබේ:

(a) පාර්ලිමේන්තු කමිටු සම්බන්ධයෙන් සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු පිළිවෙතක් ඇති කොට, එමගින් කමිටු සාමාජිකයිනට තම බලය අයථා ලෙස පරිහරණය කිරීමට ඇති ඉඩකඩ අහුරා දැමිය යුතුය. ඔවුන්ට තමන් අයත් දේශපාලන පක්ෂවල න්‍යායපත්‍රයන් වර්ධනය කරගැනීමට කමිටු ක්‍රියාකාරකම් යෙදවීම හෝ වරප්‍රසාදිත තොරතුරු අයිතිය අයථා අයුරින් පරිහරණය කිරීම වැලැක්විය යුතුය.

(b) පුද්ගලයින් සහ සංවිධාන සම්බන්ධයෙන් තීන්දු ගනු ලබන සියළු පාර්ලිමේන්තු කමිටු ස්වභාවික නීතියේ මූලික අංග දෙක ඉහළින් ගරු කළ යුතුය (එනම් තමන්ගේ විනිශ්චයකාරයා තමන් නොවිය යුතුය, තීන්දුවක් ගැනීමට පෙර සියළු සාධාරණ අවස්ථාවන් අදාල පාර්ශ්ව වෙත ලබා දිය යුතුය)

(c) කමිටුව බාහිර බලවේගයන් මගින් පාලනය නොවන බවටත්, දේශපාලන න්‍යායන්, කමිටු සාමාජිකයින්ගේ පුද්ගලික සැලසුම් සහ පක්ෂ ප්‍රතිපත්ති කමිටුවේ තීරණ ගැනීමේදී සාදක නොවන බවටත් තහවුරු කිරීම කමිටුවේ පරම යුතුකම වන්නේය.

(d) පාර්ලිමේන්තු වරප්‍රසාද පනතේ 9 වැනි වගන්තියේ B කොටස ඉවත් කොට එය සංශෝධනය කොට කමිටුවක කටයුතු හා විභාගයන් පිළිබඳ මහජනතාවට තම අදහස් දැක්වීමට ඇති අයිතිවාසිකම් තහවුරු කළ යුතුය.

අවසාන වශයෙන්, පාර්ලිමේන්තුව සහ එහි කමිටු මෙරට ජනතාවට තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පිළිබඳව අවධානයෙන් සිටිනු ඇතැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය බලාපොරොත්තු වෙයි. පොලිස් ව්‍යපෘතිය සම්බන්ධයෙන් ''කා විසින් කුමන තොරතුරු දුන්නේද'' යන සරල පැනය ආශ්‍රයෙන් කමිටුව අසාධාරණ තීන්දු ගතහොත් රහසිගතභාවය න්‍යායක් වූ රටක තොරතුරු ලබාගැනීමට මහජනතාවට ඇති අයිතිය කෙළෙසී යනු ඇත.

**ජේ. සී. වැලිඅමුණ**
විධායක අධ්‍යක්ෂ
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

****